සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2018

**08 ශ්‍රේණිය** **ඉස්ලාම් ධර්මය** **කාලය පැය 02යි.**

| නම/ විභාග අංකය: |
|---|

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

## I කොටස

01. තව්හීදයට විරුද්ධ සෑම විශ්වාසයක්ම හඳුන්වන්නේ,
    (1) රිසාලත් (2) මආද් (3) තව්හීද් (4) ෂිර්ක්

02. 'ඉන්ජීල්' දේව ග්‍රන්ථය ලැබූ නබිවරයාණන්,
    (1) මූසා(අලෛ) (2) දාවූද්(අලෛ) (3) නූහ්(අලෛ) (4) ඊසා(අලෛ)

03. නූහ් නබි(අලෛ) තුමන්ගේ විශේෂිත නාමය,
    (1) රූහුල්ලා (2) අබුල් බෂර් (3) කලීමුල්ලාහ් (4) කලීලුල්ලාහ්

04. රමධාන් මාසයට පෙර මාසය හඳුන්වන්නේ,
    (1) ෂඅබාන් (2) මුහර්රම් (3) ෂව්වාල් (4) සපර්

05. 'යතීම්' යන අරාබි පදයෙන් හඳුවන්නේ,
    (1) මව (2) අනාථයා (3) වැන්දඹු (4) මහලුවන්

- **පහත අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් ( ✓ ) ලකුණද වැරදි නම් ( ✗ ) ලකුණද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

06 නබි(සල්) තුමානන්ගේ බිරින්දෑවරුන් හැඳින්වූයේ. (..........)
07 අල්කුර්ආනය ''වහී මත්ලු'' ගණයට අයිතිය. (..........)
08 සුනන් අර්බආ කොටසෙහි හදීස් ග්‍රන්ථ තුනක් අඩංගු වේ. (..........)
09 ගමනකදී නායකයෙක් තෝරා පත්කර ගැනීම ගමන් නීති රීතිවල එකකි. (..........)
10 නාමුසුල් ඈලම් යනු පිරබ්ලාලේ(අලෛ) තුමන්ගේ විශේෂිත නාමය කි. (..........)

- **අංක 11 සිට 15 දක්වා පහත සඳහන් වචනයන් නිවැරදි ලෙස යා කරන්න.**

| | | |
|---|---|---|
| 11 | රසූල්වරුන් | 2630 |
| 12 | උලුල් අස්ම් | තක්වා |
| 13 | පර්ල් කිපායා | 313 |
| 14 | සව්මයේ අරමුණ | ජනාසා සලාතය |
| 15 | අබ්දුල්ලාහ් ඉබ්නු උමර්(රලි) | මූසා(අලෛ) |

- **පහත සඳහන් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

16 ඉබ්රාහීම්(අලෛ) තුමානන් .................................................................................................... හැඳින්වූහ.
17 විවාහවීමට තහනම් අයවලුන් .................................................................................................... වේ.
18 බීඃරු රූමා යන ළිඳ මිලදීගෙන මුස්ලිම්වරුන්ට වක්ෆ් කල කලීපා .................................................. ය.
19 ''ආමුල් හුස්න්'' යනු .................................................................................................... වේ.
20 සියලු භාණ්ඩවලට දිය හැකි .................................................................................................... වේ.

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

(01) කෙටි පිළිතුරු සපයන්න.

(i) කුඩා ළමුන් වැඩිහිටියන්ගෙන් බලාපොරොත්තුවන කරුණු 02 ක් සඳහන් කරන්න.

(ii) වහීහි කොටස් දෙක නම් කරන්න.

(iii) උම්මහාතුල් මුඃමිණීන්වරුන්ගෙන් දෙදෙනෙක් සඳහන් කරන්න.

(iv) ඉස්ලාමික ඉතිහාසයේ මුස්ලිම්වරුන් පළමුව හිජ්රත් ගියේ කොහේ ද?

(v) අවසන් දිනයේ රැගෙන එනු ලබන සාක්ෂි දෙකක් නම් කරන්න.

(vi) පොදු දේපල 02 ක් සඳහන් කරන්න.

(vii) අප පිළිපැදිය යුතු යහපත් ගුණාංගයක් සඳහන් කරන්න.

(viii) අල්කුර්ආනයේ අන්තර් ගත කරුණු 02 ක් නම් කරන්න.

(ලකුණු 02×08=16)

(02) (i) අල්ලාහ්ගේ කරුණාව පෙන්වාදෙන ශුද්ධ නාමයන් 03 ක් සඳහන් කරන්න.

(ii) නබි(සල්) තුමානන්ගේ ඉතිහාසයේ මුහුණදුන් අභියෝගයන් 04 ක් සඳහන් කරන්න.

(iii) අල්ලාහ්ගෙන් උපකාර පැතීමෙන් ලැබෙන ප්‍රයෝජනයන් 04 ක් සඳහන් කරන්න.

(ලකුණු 3+4+4=11)

(03) (i) අල්කුර්ආනය මුඃජිසා නම් ආශ්චර්යයක් ලෙස ලැබූ නබිවරයානන් කව්රුන්ද?

(ii) ප්‍රාර්ථනාමේ යෙදෙනවිට පිළිපැදිය යුතු ක්‍රමවේදයන් 04 ක් නම් කරන්න.

(iii) අල්කුර්ආනයේ අන්තර්ගතය පිළිබඳ පහත සඳහන් කරුණු ගැන සඳහන් කරන්න.

- වාක්‍ය
- පරිච්ඡේද
- ජුස්උ
- සජ්දා

(ලකුණු 3+4+4=11)

(04) (i) සමාජ සේවය යනු කුමක්ද?

(ii) මව්ලූ හදීසයන් සමාජගත වීමට හේතු 04 ක් සඳහන් කරන්න.

(iii) සමාජ සේවාව පිළිබඳ සහාබාවරුන්ගේ ජීවිතයේ සිදුවූ සිද්ධියක් සඳහන් කරන්න.

(ලකුණු 3+4+4=11)

(05) (i) අන් අයගේ උදව් අවශ්‍යවන තිදෙනෙක් නම් කරන්න.

(ii) අන් අයට අපෙන් කළයුතු උපකාර 4 ක් සඳහන් කරන්න.

(iii) පහත සඳහන් අරාබි වචනයන් වල අර්ථය සඳහන් කරන්න.

- මාඋඌන්
- යතීම්
- මිස්කීන්
- සාහුන්

(ලකුණු 3+4+4=11)

(06) (i) සුන්නත් සලාතයන් 03 ක් සඳහන් කරන්න.

(ii) දේවග්‍රන්ථ 04 ක් සඳහන් කර ඒවා ලැබූ නබිවරුන් ද සඳහන් කරන්න.

(iii) සලාතය නම් නැමදීම පිළිබඳ හදීසයක් සඳහන් කරන්න.

(ලකුණු 3+4+4=11)

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **තෙවන වාර පරීක්ෂණය 2018**

**08 ශ්‍රේණිය** **ඉස්ලාම් ධර්මය**

**පිළිතුරු පත්‍රය - I කොටස**

(01) ෂිර්ක් (02) ඊසා (අලෛ) (03) අබූල් බෂර් අස්සාහි (04) ෂඃබාන් (05) අනාථයා
(06) ✓ (07) ✓ (08) × (09) ✓ (10) ✓ (11) 313 (12) මූසා(අලෛ)
(13) ජනාසා සලාතය (14) තක්වා (15) 2630 (16) අබූල් අහිබියා (17) මහ්රම්
(18) උස්මාන් (රලි) (19) දුක්මුසු වසර (20) සදකා

**II කොටස**

(01) (i) ආදරය - ආරක්ෂාව
(ii) වහී මත්ලුව්, වහී කයිරු මත්ලුව්
(iii) සෆියා(රලි), ජුවෙයිරියා(රලි)
(iv) හබ්ෂාවට, 15 දෙනෙක්
(v) ශරීර කොටස්, මලක්වරුන්ගේ සටහන්, අකුසල් සිදුවූ ස්ථාන
(vi) බස්නැවතුම් - මාර්ග
(vii) සත්‍ය ප්‍රකාශ කිරීම - විශ්වාසව හැසිරීම
(viii) නොපෙනෙන දේවල් - වත් පිළිවෙත්

(ලකුණු 02×08=16)

(02) (i) අර් රහ්මාන් - අර් රහීම්, අල්වදූද්
(ii) 1. හූනියම් කරන්නා, මන්ද බුද්ධිකයා යනුවෙන්
2. ෂිඃබුඅබී තාලිබ්හි හිර කිරීම
3. තව්හිද් හා ෂිර්ක් අතර සමථ කිරීමට උත්සාහ දැරීම
4. නබිතුමාණන්ට උපකාර කළ කදීජා(රලි) හා අබු තාලිබ් ගේ මරණය සිදුවීම
(iii) 1. අල්ලාහ් ගැලපෙන කාන්තාවන් කෙරෙහි මඟ පෙන්වීම.
2. අල්ලාහ්ගේ ලංවීම ලැබීම.
3. අල්ලාහ්ගෙන් උපකාර පැතීමට කුසල් ලැබීම.
4. අපගේ ගෞරවය ආරක්ෂා වීම.

(ලකුණු 3+4+4=11)

(03) (i) මුහම්මද්(සල්) තුමාණන්ට
(ii) වුලු සමඟ ප්‍රාර්ථනා කිරීම / කිබ්ලාව දෙසට සිටීම / තුන්වතාවක් ඇසීම / අල්ලාගේ ශුද්ධ නාමය සඳහන් කිරීම
(iii) • වචන - 6666 • පරිච්ඡේද - 114 • ජුස්උ - 30 • සජ්දා 15 (ලකුණු 3+4+4=11)

(04) (i) මහජනයාගේ යහපත සඳහා කිසිදු උපකාරයක් බලාපොරොත්තු නොවී තනිව හෝ ආයතන ගතව උදව් කරන්නාවූ සමාජ සත්කාරයන්
(ii) අල්ලාහ්ගේ කරුණාව ලැබීම / දේශපාලන අදහස්වලට ශක්තිය ලබා ගැනීම / පොළ ව්‍යාපාරිකයින් / ප්‍රසිද්ධ වීමේ හේතුවෙන්
(iii) මදීසාවෙහි රූමා නම් යුදෙව් ජාතිකයෙක් ලිඳේ වතුර වැඩි මිලකට විකුණුහ. එම නිසා ''කව්රුන් හෝ රූමාගේ මෙම ලිඳ මිලදී ගෙන මහජනයාට වක්ෆ් කරයිද ඔහුට ස්වර්ගය ලැබේවී'' යනුවෙන් නබි(සල්) තුමානන් පැවසූහ. එවිට උස්මාන් (රලි) තුමානන් බිඃරු රූමාව මිලදී ගෙන මහජනයාට ප්‍රයෝජනය සඳහා ලබා දුන්හ.

(ලකුණු 3+4+4=11)

(05) (i) දුප්පතා / අනාථයා / වැන්දඹු කාන්තාව
(ii) ආහාර දීම / ඇඳුම් ලබාදීම / යහපත් වචනකීම / සුභ පැතීම
(iii) • මාඋන් - සුළු ද්‍රව්‍ය • යතීම් - අනාථයා • මිස්කීන් - දුප්පතා • සාහුන් - උවමනාවෙන් තොර සිටීම

(ලකුණු 3+4+4=11)

(06) (i) ලුහා, තහජ්ජත්, ග්‍රහණ සලාතයන්
(ii) සබූර් - දාවූද්, තව්රාත් - මුසා - ඉන්ජීල් - ඊසා, පුර්කාන් - මුහම්මද් (සල්)
(iii) ''සලාතය ස්වර්ගයේ යතුර වේ.''